# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : PE /24/2015<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2015.07.01<br>திகதி |

චක්‍රලේඛ අංක TR/2015/01

<u>හදිසියි / ඉතා වැදගත්ය.</u>

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවර ලේකම්වරු / සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරු /
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් වෙත,

<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17</u>
<u>ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යෙදවීම පිණිස රජයේ වාහන ලබාදීම.</u>

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඉහත සඳහන් ඡන්ද විමසීමේදී ඡන්ද පොළ රාජකාරී සඳහා තෝරා ගන්නා ලද නිලධාරීන්ද, උපකරණ හා ලිපිද්‍රව්‍ය ආදියද, ප්‍රවාහනය කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික්කයන්හි භාරකාර නිලධාරීන්ට කාර්, ජීප්, ස්ටේෂන් වැගන්, වෑන්, ඩබල් කැබ්, සිංගල් කැබ්, බස් ආදී වශයෙන් මෝටර් රථ වාහන විශාල ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත. එබැවින් රාජ්‍ය ආයතන සතුව ඇති මනා ධාවන තත්වයෙන් යුත් සෑම මෝටර් වාහනයක්ම ඉහත සඳහන් ඡන්ද විමසීමේදී යොදා ගැනීම පිණිස ලබා ගත යුතුව ඇත.

02. 2015.01.08 දින පැවැති ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා සිදු කරන ලද වාහන සංගණනයෙන් ලබා ගත් තොරතුරු මත මෙම ඡන්ද විමසීම සඳහාද වාහන ලබා ගැනීමට බලාපොරොත්තු වන හෙයින් එම තොරතුරු කඩිනමින් යාවත්කාලීන කළ යුතුව ඇත. එබැවින් ඔබගේ අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි ඇති මනා ධාවන තත්වයකින් යුත් සියළු වාහන වල තොරතුරු යාවත්කාලීන කර ඔබ දිස්ත්‍රික්කයේ භාරකාර නිලධාරී / දිසාපති වෙත කඩිනමින් යැවීමට කටයුතු යොදන ලෙස කාරුණිකව දන්වමි. (කොළඹ දිස්ත්‍රික්කයේ තොරතුරු රාජගිරිය සරණ මාවතේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයට එවිය යුතු වේ.) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව වෙන් කල වාහන සඳහා හිමිකම් ඇති නිලධාරීන්ට වෙන්කර දී ඇති වාහන වල විස්තරද කරුණාකර සඳහන් කරන්න.

03. තවද වෙන්කළ වාහන හිමිකම් ඇති නිලධාරීන් සඳහා එක් වාහනයක් පමණක් වෙන්කර දියයුතු අතර අනෙකුත් සියළුම වාහන මෙම ඡන්ද විමසීමේදී අදාළ දිස්ත්‍රික් ලේකම්/භාරකාර නිලධාරීන් වෙත ලබාදීමට කටයුතු කරන ලෙසට අදාළ ආයතන ප්‍රධානීන්ට කරුණාකර උපදෙස් දෙන්න.

04. ඇතැම් රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් පසුගිය ඡන්ද විමසීම් වලදී දිස්ත්‍රික් භාරකාර නිලධාරීන් / දිස්ත්‍රික් ලේකම් විසින් මැතිවරණ රාජකාරී සඳහා නිදහස් කර එවන ලෙස දැනුම් දෙන ලද සියළු වාහන දිස්ත්‍රික් භාරකාර නිලධාරී වෙත නිදහස් කර යැවීමට කටයුතු නොකළ අවස්ථාවන් වාර්තා වී ඇත. එසේ කටයුතු කිරීම නිසා අදාළ දිස්ත්‍රික් භාරකාර නිලධාරීන් දැඩි අපහසුතාවයකට පත්වන හෙයින් මැතිවරණ රාජකාරී සඳහා තෝරාගත් බවට දිස්ත්‍රික් ලේකම් / භාරකාර නිලධාරී දැනුම් දෙනු ලබන සියළුම වාහන නොපමාව නිදහස් කර යැවීමට කටයුතු කරන ලෙසට ඔබගේ නිලධාරීන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

05. සාමාන්‍යයෙන් ඡන්ද විමසීම පැවැත්වෙන දිනට කලින් සම්පූර්ණ දින තුනක කාල සීමාවක් සඳහා මෙම මෝටර් රථ වාහන අවශ්‍ය වන අතර, ඡන්ද විමසීමේ දිනයට පසු දෙවැනි දිනයේ ඒවා ආපසු මුදා හරිනු ඇත.

06. තවද ඔබ ආයතනයෙන් තොරතුරු ලබා දෙන ලද වාහනවල සුළු අළුත්වැඩියාවන් තිබේනම් ඒවා ද සේවා කිරීම් වේනම් එවාද සිදුකර, ඡන්ද විමසීමේ රාජකාරී කටයුතු වල යෙදවීම සඳහා නිදහස් කර එවන ලෙස දැනුම් දුන් වහාම එවා නිදහන් කර යැවීමට හැකිවෙන පරිදි තබා ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

07. ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යෙදිවීම පිණිස ඔබ විසින් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී (දිස්ත්‍රික් ලේකම්වරුන්) වෙත ලබාදෙන වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලිහිසි තෙල් ආදිය තේරීම් භාර නිලධාරීන් විසින් ඉන්ධන ඇණවුම් මඟින් සැපයීමට කටයුතු සලස්වනවා ඇත. වාහන අයත් ආයතනය විසින් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීගේ කාර්යාලයට වාර්තා කිරීමට යාමට ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබා දෙන්න. එම ඉන්ධන සඳහා වැය වූ මුදල මැතිවරණ වැය ශීර්ෂය යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කරනු ඇත. ඉන්ධන ප්‍රතිපූරණය කිරීම, රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම සහ ඡන්ද විමසීම් රාජකාරීවල නිරත කරවන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීම පිළිබඳ උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

08. සියළුම රියදුරන්ට හා රිය සහායකයන්ට තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් ලබා ගැනීමට හිමිකම් ඇති හෙයින් ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ රියදුරන් හා රිය සහායකයින් මේ පිළිබඳව දැනුවත් කර අවශ්‍ය කටයුතු යෙදීම ඉතා වැදගත් බව කාරුණිකව දන්වමි.

09. දහනව වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 වන වගන්තියෙන් මැතිවරණ කොමිෂම වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කර ඇති බව කාරුණිකව සලකනු මැනවි.

10. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේදී සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ සහාය අත්‍යවශ්‍ය බව අවධාරණය කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*

මැතිවරණ දෙපාර්තමේන්තුව
தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)
தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය : PE /24/2015<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2015.07.03<br>திகதி |

චක්‍රලේඛ අංක TR/2015/01

<u>හදිසියි / ඉතා වැදගත්ය.</u>

අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2015.08.17</u>**
**<u>ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යෙදවීම පිණිස රජයේ වාහන ලබාදීම.</u>**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ඉහත සඳහන් ඡන්ද විමසීමේදී ඡන්ද පොළ රාජකාරී සඳහා තෝරා ගන්නා ලද නිලධාරීන්ද, උපකරණ හා ලිපිද්‍රව්‍ය ආදියද, ප්‍රවාහනය කිරීම සඳහා එක් එක් දිස්ත්‍රික්කයන්හි තේරීම්භාර නිලධාරීන්ට කාර්, ජීප්, ස්ටේෂන් වැගන්, වෑන්, ඩබල් කැබ්, සිංගල් කැබ්, බස් ආදී වශයෙන් මෝටර් රථ වාහන විශාල ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත. එබැවින් රාජ්‍ය ආයතන සතුව ඇති මනා ධාවන තත්වයෙන් යුත් සෑම මෝටර් වාහනයක්ම ඉහත සඳහන් ඡන්ද විමසීමේදී යොදා ගැනීම පිණිස ලබා ගත යුතුව ඇත.

02. ඔබේ අමාත්‍යාංශයේ ඇති මනා ධාවන තත්වයකින් යුත් සියළු වාහන පිළිබඳ තොරතුරු මෙයට යාකර ඇති වාහන සංගණන ආකෘති පත්‍රයට ඇතුළත් කර මෙම චක්‍රලේඛය ලැබී දින 05 ක් ඇතුලත රාජගිරිය සරණ මාවතේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත අතින් ගෙනවිත් භාරදෙන ලෙසට ඔබට කාරුණිකව දන්වමි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව වෙන් කල වාහන සඳහා හිමිකම් ඇති නිලධාරීන්ට වෙන්කර දී ඇති වාහන වල විස්තරද කරුණාකර සඳහන් කරන්න.

03. තවද වෙන්කළ වාහන හිමිකම් ඇති නිලධාරීන් සඳහා එක් වාහනයක් පමණක් වෙන්කර දියයුතු අතර අනෙකුත් සියළුම වාහන මෙම ඡන්ද විමසීමේදී භාවිතයට ගැනීමට හැකිවන සේ නිදහස් කළයුතු වේ.

04. ඇතැම් රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් පසුගිය ඡන්ද විමසීම් වලදී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් / දිස්ත්‍රික් ලේකම් විසින් මැතිවරණ රාජකාරී සඳහා නිදහස් කර එවන ලෙස දැනුම් දෙන ලද සියළු වාහන දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී වෙත නිදහස් කර යැවීමට කටයුතු නොකළ අවස්ථාවන් වාර්තා වී ඇත. එසේ කටයුතු කිරීම නිසා අදාළ දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් දැඩි අපහසුතාවයකට පත්වන හෙයින් මැතිවරණ රාජකාරී සඳහා තෝරාගත් බවට දිස්ත්‍රික් ලේකම් / තේරීම්භාර නිලධාරී දැනුම් දෙනු ලබන සියළුම වාහන නොපමාව නිදහස් කර යැවීමට කටයුතු කරන ලෙසට ඔබගේ නිලධාරීන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

05. සාමාන්‍යයෙන් ඡන්ද විමසීම පැවැත්වෙන දිනට කලින් සම්පූර්ණ දින තුනක කාල සීමාවක් සඳහා මෙම මෝටර් රථ වාහන අවශ්‍ය වන අතර, ඡන්ද විමසීමේ දිනයට පසු දෙවැනි දිනයේ ඒවා ආපසු මුදා හරිනු ඇත.

06. තවද ඔබ ආයතනයෙන් තොරතුරු ලබා දෙන ලද වාහනවල සුළු අළුත්වැඩියාවන් තිබේනම් ඒවා ද සේවා කිරීම් වේනම් එවාද සිදුකර, ඡන්ද විමසීමේ රාජකාරී කටයුතු වල යෙදවීම සඳහා නිදහස් කර එවන ලෙස දැනුම් දුන් වහාම එවා නිදහන් කර යැවීමට හැකිවෙන පරිදි තබා ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

07. ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යෙදිවීම පිණිස ඔබ විසින් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී (දිස්ත්‍රික් ලේකම්වරුන්) වෙත ලබාදෙන වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලිහිසි තෙල් ආදිය තේරීම් භාර නිලධාරීන් විසින් ඉන්ධන ඇණවුම් මගින් සැපයීමට කටයුතු සලස්වනවා ඇත. වාහන අයත් ආයතනය විසින් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීගේ කාර්යාලයට වාර්තා කිරීමට යාමට ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබා දෙන්න. එම ඉන්ධන සඳහා වැය වූ මුදල මැතිවරණ වැය ශීර්ෂය යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කරනු ඇත. ඉන්ධන ප්‍රතිපූරණය කිරීම, රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම සහ ඡන්ද විමසීම් රාජකාරීවල නිරත කරවන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීම පිළිබඳ උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

08. සියළුම රියදුරන්ට හා රිය සහායකයන්ට තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් ලබා ගැනීමට හිමිකම් ඇති හෙයින් ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ රියදුරන් හා රිය සහායකයින් මේ පිළිබඳව දැනුවත් කර අවශ්‍ය කටයුතු යෙදීම ඉතා වැදගත් බව කාරුණිකව දන්වමි.

09. දහනව වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 වන වගන්තියෙන් මැතිවරණ කොමිෂම වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කර ඇති බව කාරුණිකව සලකනු මැනවි.

10. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේදී සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ සහාය අත්‍යවශ්‍ය බව අවධාරණය කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්


මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி : 011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@slelections.gov.lk*

පරිපාලන නිලධාරී
நிருவாக அலுவலர்
දුරකථන/தொலைபேசி : 011-3083371
ෆැක්ස්/தொலைநகல் : 011-3083371
*e-mail : info@slelections.gov.lk*